# භාෂාව ධ්වනිතාර්ථවත් ලෙස භාවිත කිරීම සන්නිවේදන ක්‍රියාදාමයට බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනයක්

**ඩී. එන්. ඇලෝසියස්**


## සංක්ෂිප්තය

සන්නිවේදනය සඳහා භාෂාව විවිධ ආකාරයෙන් භාවිත කරනු ලැබේ. එය ප්‍රධාන වශයෙන් වාචික හෝ ලිඛිත වන අතර සංකේතාත්මකව ද අදහස් ප්‍රකාශ කරන අවස්ථා ඇත. මෙම අධ්‍යයනයට පාදක වන්නේ භාෂාව මගින් අදහස් සහ හැඟීම් ප්‍රකාශ කිරීමට යොදා ගන්නා විවිධ ක්‍රම පිළිබඳවය. යමෙක් තම අදහස් ප්‍රකාශ කිරීමේදී එය සෘජුව භාවිත නොකොට වක්‍රව භාවිත කරන අවස්ථා ඇත. මෙය සන්නිවේදන ක්‍රියාදාමය තුළ වඩාත් සැලකිය යුතු සහ අවධානය යොමු කළ යුතු කාරණයකි. මේ පිළිබඳව මනා අවබෝධයක් නොතිබීම සන්නිවේදන ක්‍රියාදාමයට බෙහෙවින් බලපාන අතර, ඒ තුළින් යමක් ප්‍රකාශ කිරීමට අදහස් කරන දෙය නිවැරදිව තවත් කෙනෙකුට අවබෝධ කරගැනීමට ඇති අවකාශය සීමාසහිතය. මෙමගින් සන්නිවේදනයේ දී නොයෙකුත් අර්බුද සහ ගැටළු ඇති කරනු ලැබේ. තම පවුලේ සාමාජිකයින් අතර කිසියම් ප්‍රජාවක හෝ ආයතනයක මෙම ගැටළුව පැන නැගිය හැක. එසේ නම් භාෂාව භාවිත කිරීමේදී එය වක්‍රව යොදා ගැනීම පිළිබඳව කෙනෙකුට මනා අවබෝධයක් තිබිය යුතුමය. එවිට සන්නිවේදන කටයුත්ත ඉතාමත් සාර්ථකව කෙරෙන අතර අර්බුද සහ අපහසුතා ද ඇති නොවේ. වර්තමානයේදී ඇතැම් සංකීර්ණ ගැටළුවලට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම දුර්වල සන්නිවේදන ක්‍රියාදාමය යි. මෙකී අධ්‍යයනයේ අරමුණ වන්නේ තත් ගැටළු හඳුනාගෙන වඩාත් සාර්ථක සන්නිවේදන කාර්යයක නියැලෙන්නේ කෙසේද යන්න විමසා බැලීමයි.


**යොමු වචන** :- ධ්වනිතාර්ථ, සන්නිවේදන ක්‍රියාදාමය, වාචික අවාචික සන්නිවේදනය, පූර්ව අත්දැකීම්